# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව** |
| **දිනය** | : | **2014-10-30** |
| **වේලාව** | : | **පෙ.ව. 10.00** |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්.ටී.එම්.රූම් මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ.මලික්ෂා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් කාර්යය මණ්ඩලය හා ගරු මන්ත්‍රිවරුන්ගේ දායකත්වය හා කැපවීම මත 2012/2013 පළාත් පාලන කළමණාකරන තරඟයෙන් ප්‍රථම ස්ථානය බලංගොඩ නගර සභාවට හිමිවූ බවත් ඉන් නොනැවති ජාතික මට්ටමේ තරඟාවලියක් වන ස්වර්ණ පුරවර තරඟයේදි බලංගොඩ නගර සභාව සතු කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා ප්‍රථම ස්ථානයත්,පළාත් පාලන ආයතන අතර පවත්නා පළාත් පාලන කළමණාකරන තරඟයේදි බලංගොඩ නගර සභාවට දෙවන ස්ථානයත් , නගර සභා පුස්තකාලය සඳහා හොඳම පුස්තකාල අතරින් දෙවන ස්ථානයත් ,ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පිරිනමන ලද පුස්තකාල

ඇගයීම් තරඟාවලියේ දෙවන ස්ථානයත් ලැබුන බවට සභාව වෙත දන්වන ලදී.මේ පිළිබඳව තමන් ඉතා අභිමානයට හා ප්‍රීතියට පත්වන බව පැවසූ ගරු සභාපතිතුමා, තරඟ විනිශ්වයකරුවන්ගේ අධීක්ෂණ හා නිරීක්ෂන ඔස්සේ තරඟ මෙවෙලමට අනුව නීත්‍යානුකූලව ක්‍රියාකර ලබාගත් ජයග්‍රහණය ඉතා ප්‍රශංසාත්මක බවත් මේ සඳහා කැප වී ක්‍රියාකල ගරු උප සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලයටත්, නිලධාරී මණ්ඩලයේ සිට සෞඛ්‍ය කම්කරුවා දක්වා වූ සියළු සේවක සේවිකාවන් වෙත තමන්ගේ ස්තුතිය පිරිනමන අතර ඒ සඳහා ප්‍රශංසාත්මක ලිපි පෞද්ගලික ලිපිගොණුවලට ඇතුළත් කරන බවත් පවසන ලදී.මෙහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා මෙම ජයග්‍රහණ වෙනුවෙන් කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා තුන්ලක්ෂ පනස්දහසක මුදලකුත්, කළමණාකරනය තරඟය සදහා තුන්ලක්ෂ පනස්දහසක මුදලකුත්, පුස්තකාලය සඳහා රු.හැත්තෑපන් දහසක මුදලකුත්,මුදල් ත්‍යාග ලෙස ලැබුන බවත්, පුස්තකාල කාර්යය මණ්ඩලයේ ඉල්ලීම පරිදි පුස්තකාලය සඳහා ලද ත්‍යාග මුදලින් ඔවුන්ගේ රාජකාරී කටයුතු සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලට ගෙන ලබාදෙන අතර,ඉතිරි හත් ලක්ෂයක මුදල වැය කරන අන්දම පිළිබඳ ඉදිරි දිනෙක කළමණාකරන කමිටු රැස්වීමක් පවත්වා තීරණයක් ගන්නා බවත් ගරු සභාව වෙත පවසන ලදී.

එමෙන්ම ඔක්තොම්බර් 29 වෙනි දින කොස්ලන්ද,වැල්ලවාය මාර්ගයේ නාය යාම පිළිබඳව එම සිද්ධියෙන් පීඩාවට පත්වූ පවුල්වල සියළුදෙනා වෙනුවෙන් තම ශෝකය ප්‍රකාශ කල ගරු සභාපතිතුමා එම ව්‍යවසනය මැඩපැවත්වීම සඳහා රජය කඩිනමින් ක්‍රියා කිරීම පිළිබඳ ස්තුති කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා බවත් පැවසීය.

එමෙන්ම ඉදිරි වර්ෂයේ දී සභාව විසින් ජනතාවට සේවය කිරීම සඳහා ගන්නා තීන්දු තීරණ ගෙන ඒවා සඵලදායි ලෙස ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය සහය සභාව වෙත ලබාදෙන මෙන් ගරු සභාපතිතුමන් විසින් ඉල්ලා සිටින ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

මෙදින සභාවේදි සමාලෝචන කිසිවක් ඉදිරිපත් නොවන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 පොදු වෙළදසැල අංක 05 කඩ කාමරයේ හිමිකාරීත්වය පැවරීම. සුමතිපාල හෙට්ටිආරච්චි.

සුමතිපාල හෙට්ටිආරච්චි නමින් බදු හිමිකාරීත්වය පවත්වාගෙන ආ පොදු වෙළෙද සැල අංක 05 දරණ කඩ කාමරය අණපනත් හා නීතිරීති වලට අනුකූලව ඔහුගේ පුත් ඉන්දික රොෂාන් හෙට්ටි ආරච්චි යන නමින් වෙනස් කර දෙන ලෙස කර තිබූ ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කල ගරු සභාපතිතුමා,බදු අයිතිය වෙනස් කර නව බදුකරු නමින් ගිවිසුම් අත්සන් කිරීමට යෝජනා කරන ලදී.

ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ අතර එය මහ සභාවේ සම්මත විය.

### 06:02 මැණික් කඩ අංක 09 බදු අයිතිය පැවරීම. එස්.එල්.ජේ.බණ්ඩාර

එස්.එල්.ජේ.බණ්ඩාර විසින් මැණික් කඩ අංක 09 බදු අයිතිය පැවරීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදුව සියළු මැණික් කඩ හිමියන් කැඳවා ටෙන්ඩර් කිරීම සඳහා සාකච්ඡා කර තීරණයක් ගැනීමට යෝජනා කරන ලදී.
මේ සඳහා වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහාසභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 කසල කොන්ත්‍රාත්තුවේ මිල ගණන් සංශෝධනය කර ගැනීම. බී ගුණරත්න**

දැනට ගෙවනු ලබන කොන්ත්‍රාත් මුදල සේවක ගෙවීම් හා වෙනත් වියදම් ආවරණය කරගැනීමට ප්‍රමාණවත් නොවන බව පවසමින්,බී ගුණරත්න විසින් කසළ කොන්ත්‍රාත්තුවේ මිල ගණන් සංශෝධනය කර දෙන මෙන් කර තිබූ ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

මෙහිදී මේ පිළිබඳව සාකච්ඡා කර දිනකට රු.1500 බැගින් දින 30 සඳහා එනම් මසකට රු.45000 බැගින් වැඩිකිරීමට තීරණය කර නැවත ටෙන්ඩර් කිරීමට යටත්ව ගෙනා එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 සුසාන භූමි නඩත්තු වෙනුවෙන් ගෙවනු ලබන මුදල වැඩිකර ගැනීම. ඩබ්.එල්.චන්ද්‍රසිරි තිලකරත්න.**

සුසාන භූමි නඩත්තු වෙනුවෙන් ගෙවනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව පවසා ඩබ්.එල්.චන්ද්‍රසිරි තිලකරත්න යන අය එම මුදල වැඩිකර දෙන මෙන් කරතිබූ ඉල්ලීම් ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් සියළු සුසාන භූමි සඳහා සුසාන භූමි දීමනාව රු.2500 කින් වැඩිකිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 පසුගිය සභාවේදි සාකච්ඡා කල පරිදි කිරිදිගල ජල ටැංකිය යාබද ඉඩම පිළිබද ආදායම් පරීක්ෂකාගේ වාර්තාව**

කිරිදිගල ජල ටැංකිය යාබද ඉඩම පිළිබද ආදායම් පරීක්ෂකගේ වාර්තාව මහ සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් මෙම ඉඩමේ අයිතිය නගර සභාව වෙත ඉල්ලමින් ප්‍රාදේශිය ලේකම්තුමාගෙන් ලිපියක් ලබාගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 පොදු වෙළදසැල අංක 15,16.17 සහ රථ වාහන නැවතුම් අය කිරීමේ ටෙන්ඩර් මණ්ඩල තීරණ දැනුම් දීම.**

2014.10.16 වන දින ගනු ලැබූ අංක 15 දරණ එළු මස් කඩය සඳහා අවම ලංසු මුදල රු.75,750 ලෙසත්,අංක 16 දරණ හරක් මස් කඩය සඳහා අවම ලංසු මුදල රු.1,500,950 ලෙසත්,අංක 17 දරණ කුකුල්මස් කඩය සඳහා අවම ලංසු මුදල රු.75,750 ලෙසත්,රථවාහන නැවතුම් ගාස්තුව සඳහා අවම ලංසු මුදල රු.87,850 ලෙසත් ගෙන ඇති ටෙන්ඩර් මණ්ඩල තීරනයන් සඳහා සභා අනුමැතිය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 කසල ඉවත් කිරීමේ හා පොදු වැසිකිළිය ටෙන්ඩර් කිරීමේ ටෙන්ඩර් මණ්ඩල තීරණ දැනුම් දීම.**

2015 වර්ෂය සඳහා බලන්ගොඩ බස්නැවතුම්පොල හා මහජන පොල,පොදු වැසිකිලි නඩත්තු කිරීම හා ගාස්තු අයකර පවත්වාගෙන යාම, බලන්ගොඩ නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහණය

කිරිම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩලයේ තිරණය සඳහා අනුමැතිය ලබාගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ සම්බන්ධව වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 හිඟ කඩකුළී අයකර ගැනීම. කඩ අංක ඩී 11**

ඉන්දික නිරෝෂණ යන අයට අයත් මහජන පොළ කඩ කාමර අංක ඩී 11හි ප්‍රමාද ගාස්තු හා හිඟ කඩ කුළී අයකරගැනීම සම්බන්ධ ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් ප්‍රමාද ගාස්තු ඉවත්කර හිඟ කඩ කුළිය පමනක් අය කරගැනීමට යෝජනා කරන ලදී. එහිදී එසේ තීරණයක් ගැනීමට සහා තීරණයක් පමණක් ප්‍රමාණවත්දැයි ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විමසන ලද අතර එය ප්‍රමාණවත් බව ආදායම් පරීක්ෂක මහතා විසින් දන්වන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජයන්ත පේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 බළන්ගොඩ නගරයේ වෙළඳපොළ සීමාව පුළුල් කිරිම**

2007.06.26 දින ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි බළන්ගොඩ නගර සභාවේ වෙළෙද පොළ සීමාව පුළුල් කර ගැනීම සම්බන්ධ ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා නගරයේ වෙළඳුන් කැඳවා සාකච්ඡා කර තීරණයක් ගැනීමට සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 කඩකුළී සඳහා දඩ මුදල් ඉවත්කිරිම . ඉන්දික නිරෝෂණ**

ඉන්දික නිරෝෂණ යන අයට අයත් මහජන පොළ කඩ කාමර අංක ඩී 11 සම්බන්ධව ප්‍රමාද ගාස්තු අයනොකර හිඟ කඩ කුළී පමණක් අයකරගන්නා ලෙස ඔහු විසින් කර තිබූ ඉල්ලීම් ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් ප්‍රමාද ගාස්තු ඉවත්කර හිඟ කඩ කුළිය එකවර අය කරගැනීමට පමණක් යෝජනා කරන ලදී. මේ පිළිබඳව තීරණ අංක 6:8 යටතේ විස්තර සඳහන් කර ඇත.

**06:11 පුස්තකාලය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් හා මුද්‍රණ යන්ත්‍රයක් ලබාගැනිම.**

පුස්තකාල සේවාවන් වඩාත් ජනතාවට සමීප කිරීමේ අරමුණින් පාඨකයන්ට අවශ්‍ය ඡායා පිටපත් ලබාදීම සඳහා ඡායාපිටපත් යන්ත්‍රයක් හා පුස්තකාලයේ මුද්‍රණ කටයුතු පහසුවෙන් කරගැනීම සඳහා මුද්‍රණ යන්ත්‍රයක අවශ්‍යතාවය දක්වමින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාවට ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් අවශ්‍ය මිල ගණන් කැඳවා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමට යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව තීරණය විය.

**06:12 පුස්තකාලය භාවිතා කරන දෙමළ ජාතික පාඨකයන් පිළිබද තොරතුරු ලබාදීම.**

පුස්තකාලය භාවිතා කරන 850ක් පමණ වන පාඨකයන් අතරින් 35 දෙනෙක් පමණ දෙමළ හා මුස්ලිම් පාඨකයන් සිටින බව පවසමින් ඒ පිළිබඳව පුස්තකාලයාධිපති විසින් සැපයූ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහ සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**06:13 පුහුණු වැඩසටහන් පැවැත්වීම- ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පැනැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් පිළිබද ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් නිලධාරින්ගේ ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ අරමුනින් මේ සදහා අනුමැතිය ලබාදීම සුදුසු බවත් පුහුණු ගාස්තුවෙන් අඩක් සභා මුදලින් හා ඉතිරි අඩ පෞද්ගලික මුදලින් වැය කර පුහුණු වැඩ සටහන සඳහා ඉදිරිපත්වන ලෙෂතයෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 මහජන පොළ ආපන ශාලාවේ හිඟ කඩකුළී සඳහා ප්‍රමාද ගාස්තු අඩුකර ගැනීම. බී ගුණරත්න**

මහජන පොළ ආපන ශාලාවේ හිඟ කඩ කුළිය සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීම දුෂ්කර බව පවසමින් එය අඩු කර දෙන ලෙස පවසමින් බී.ගුණරත්න මහතා විසින් කර තිබූ ඉල්ලීම් ලිපිය ,ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ප්‍රමාද ගාස්තු අඩුකර, හිඟ කුළිය පමණක් අය කිරීමට යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:15 අයාලේ යන ගවයන් සම්බන්ධව පියවරක් ගැනීම. යූ ශාන්ත අබේසේකර**

අයාලේ යන ගවයන් සම්බන්ධව පියවරක් ගන්නා ලෙස පවසමින් පොදු වෙළෙඳ සැල් භාරකරු හා පොළ කඩ හිමියන් විසින් කරතිබූ ඉල්ලීම් ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා ඒ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කිරිමට යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව තීරණය විය.

**06:16 අංක 327 දරණ ඉඩම් නඩුව සම්බන්ධ වාර්තාව. ආදායම් පරීක්ෂක**

ආදායම් පරීක්ෂක විසින් සපයන ලද අංක 327 දරණ ඉඩම් නඩුව සම්බන්ධ වාර්තාව මහ සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා වෙනත් මැණුම් නිලධාරියෙකු මගින් මෙම ඉඩම සම්බන්ධව මැණුම් කටයුතු කිරීමටත් ,නඩුව සඳහා දිගටම ඉදිරිපත් විය යුතු බවටත් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික සභා මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 බළන්ගොඩ දුර ගමන් සේවා බස් රථ නැවතුම්පොළක් ස්ථාපිත කිරීම. සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.**
සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් දන්වා එවන ලද බළන්ගොඩ නගරයේ දුර ගමන් සේවා බස් රථ නැවතුම්පොළක් ස්ථාපිත කිරීම සම්බන්ධ ලිපිය සභාවට ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් රථ වාහන පොලිසිය හා මාර්ග සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කර ඒ පිළිබද තීරණයක් ගැනිමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 මහමෙවුනා පාර පිළිසකර කර ගැනීම. ගම්වාසීන්**

මහමෙවුනා පාර පිළිසකර කර ගැනීම සම්බන්ධයෙන් ගම්වාසින් විසින් කර තිබූ ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර ඉදිරියේදි එම කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බවත් ඒ සදහා ගම්වාසින්ගේ හා දායක සභාවේ සහය අවශ්‍ය බවත් පවසන ලදී මෙහිදී ගරු සභාපතිතුමා කරන ලද යෝජනාව ගරු නාගරික සභා මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 විදුනැණ පියස මධ්‍යස්ථානය මගින් පාසල් සදහා වැඩසටහන් පැවැත්වීම- සංකල්ප ප්‍රේමදාස**

විදුනැණ පියස මධ්‍යස්ථානය මගින් පාසල් සදහා වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් අනුමැතිය පතමින් සංකල්ප ප්‍රේමදාස මහතා විසින් ඉදිරිපත් කරන ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සදහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:20 සංවර්ධන උපදේශක කාරක සභාවක් පිහිටුවීම. කර්මාන්ත අංශය**

බලන්ගොඩ නගර සභාවේ සංවර්ධන කටයුතු සාර්ථකව ඉටුකිරීමට හා සැලසුම් සකස් කිරීමේදි අවශ්‍ය උපදෙස්, යෝජනා හා අදහස් ලබා ගැනීමේ අටියෙන් පිහිටවනු ලැබූ සංවර්ධන උපදේශක කාරක සභාවට තෝරාගත් පුද්ගලයින්ගේ නාම ලේඛනය පහතින් දක්වා ඇත.

| | | |
|---|---|---|
| 01 | මනෝජ් ආරියරත්න මහතා | කථිකාචාර්ය, සබරගමුව විශ්ව විද්‍යාලය, පඹහින්න |
| 02. | ඩබ්. එම්. ජයවික්‍රම මහතා | ජල ටැංකිය පාර, කරව්කැටිය, බළන්ගොඩ |
| 03. | දේශීය වෛද්‍යාචාර්ය කවිරාජ ගුණතිලක මහතා | ගම්පහ බෙහෙත් ශාලාව, බළන්ගොඩ |
| 04. | ටී. එච්. පූජදාස මහතා | කෙළින් වීදිය, බළන්ගොඩ |
| 05. | නිමල් කුකුලවත්ත මහතා | කුමාරගම, බළන්ගොඩ |
| 06. | රේණුකා ගලප්පත්ති මහත්මිය | සුදර්ශනගම, බළන්ගොඩ |
| 07. | සිරිවර්ධන මහතා | සිරිසර පොත්හල, බළන්ගොඩ |
| 08. | මර්වින් පෙරේරා මහතා | බෝම්බුව, බළන්ගොඩ |
| 09. | චන්ද්‍රපාල මහතා | බොම්බුව, බළන්ගොඩ |
| 10. | මුණිදාස මහතා | බෝම්බුව, බළන්ගොඩ |
| 11. | රත්නසිරි මහතා | බෝම්බුව, බළන්ගොඩ |
| 12. | දර්ශන මහතා | දර්ශන ස්ටෝර්ස්, ඇල්ලෙපොල, බළන්ගොඩ |
| 13. | ආරියදාස මහතා | ඇල්ලෙපොල, බළන්ගොඩ |

| | | |
|---|---|---|
| 14. | දමිත් අමරසිරි මහතා | ඇල්ලෙපොල, බළන්ගොඩ |
| 15. | නිමල් සමරතුංග මහතා | ඇල්ලෙඅරාව, බළන්ගොඩ |
| 16. | රූපසිංහ මහතා | බුලත්ගම, බළන්ගොඩ |
| 17. | අයිසෙක් මහතා | බුලත්ගම, බළන්ගොඩ |
| 18. | ඒ. එල්. අබ්බර් අලි මුස්තාෆා මහතා | මිරිස්වත්ත, බළන්ගොඩ |
| 19. | එස්. එම්. සිද්දික් මහතා | දෙහිගස්තලාව, බළන්ගොඩ |
| 20. | එම්. එස්. එම්. නදීර් මහතා | කහටපිටිය පාර, මිරිස්වත්ත, බළන්ගොඩ |
| 21. | ඒ. එම්. හර්ෂපාල බණ්ඩාර මහතා | බුලත්ගම, බළන්ගොඩ |
| 22. | පොඩිමහත්මයා මහතා | ඕලුගංතොට, බළන්ගොඩ |
| 23. | ආරි මහතා | ඕලුගංතොට, බළන්ගොඩ |
| 24. | දයානි මහත්මිය | බලගහමුල, බළන්ගොඩ |
| 25. | යූ. එම්. එස්. ජයතුංග මහතා | ඕලුගංතොට, බළන්ගොඩ |
| 26. | නුවන් දේශාන් ගුණතුංග මහතා | මහමෙව්නාව මාවත, බළන්ගොඩ |

මෙම කාරක සභාව සඳහා අනුමැතිය පතමින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා මේ සදහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික සභා මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:21 නිවාඩු අනුමත කර ගැනීම . නගර සභා ගරු මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජෙසිංහ මැතිතුමා**

අසනීප තත්වය හේතු කොට ගෙන සභාව වෙත පැමිණිය නොහැකි බව දන්වමින් නගර සභා ගරු මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජෙසිංහ මැතිතුමා විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් නිවාඩු අනුමත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජෙ.මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**06:22 ටනකුරා කොම්පෝස්ට් ක්‍රමය නගර සභා බල ප්‍රදේශය තුළ හදුන්වා දීම. මහජන සෞඛ්‍ය පරීක්ෂක**

ටනකුරා කොම්පෝස්ට් ක්‍රමය නගර සභා බල ප්‍රදේශය තුළ හදුන්වා දීම හා ඒ සඳහා මූලික වියදම ලෙස රු.50,000 වැයකිරීමටත් අනුමැතිය ඉල්ලමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපිය සදහා අනුමැතිය ලබාදීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව තීරණය විය.

**06:23 කසල ඉවත් කිරීමේ සේවාව නැවත ටෙන්ඩර් කිරීම. මහජන සෞඛ්‍ය පරීක්ෂක**

2015 වර්ෂය සදහා කසල ඉවත් කිරීමේ සේවාව සදහා අවශ්‍ය සේවකයින් සැපයීම වෙනුවෙන් ටෙන්ඩර් කැදවීමක් කරන ලදුව 2014.10.16 වන දින කිසිදු ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් නොවූ හෙයින්

එම සේවාව සදහා නැවත ටෙන්ඩර් කිරීම අවශ්‍ය බව පවසමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට දන්වන ලද අනතුරුව ඒ පිළිබදව

සාකච්ඡා කිරීමෙන් පසු මසකට රු.45000ක් බැගින් වැඩි කර මෙය නැවත ටෙන්ඩර් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:24 කාර්ය සාධන ණය මුදල වැඩිකර ගැනීම සඳහා**

කාර්ය සාධන ණය මුදල වැඩිකර ගැනීම සඳහා කාර්යය මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් කළමණාකරන රැස්වීමක් කැඳවා එහිදී සාකච්ඡා කර තීරණයක් ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි එම්.ටී.එම්.රූම් මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව තීරණය විය.

## 07. රු. 10,000.00 ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00 ට වැඩි ගෙවීම් සියල්ල මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙවර මහා සභාවට ඇස්තමේන්තු කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

**09:01 මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය විසිතුරු මල් පැල රෝපණය කිරීම 2 වන අදියර**

මොහාන් සාලිය එල්ලාවල මාවතේ මධ්‍ය තීරයේ විසිතුරු මල් පැල රෝපණය කිරීම සඳහා අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස තුන්මෝදර, කුලියාපිටිය පාරේ සඳලිය පැල තවාන මඟින් රුපියල් එක් ලක්ෂ හැට හතර දාහක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**09:02 මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය විසිතුරු මල් පැල රෝපණය කිරීම 2 වන අදියර සඳහා මල් පෝච්චි සකස් කිරීම**

මොහාන් සාලිය එල්ලාවල මාවතේ මධ්‍ය තීරයේ විසිතුරු මල් පැල රෝපණය කිරීම සඳහා මල් පෝච්චි සකස් කිරීම සඳහා කම්බි නෙට් සීයක් යොදා ගැනීමට අවම මිල ගණන් කැඳවා ඇති

බවත්, එහි දී අවම මිල ගණන් ලෙස දෙහිගස්තලාව කිත්මි අයන් වර්කර්ස් ආයතනයමඟින් රුපියල් දෙලක්ෂ හැට දහසක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**09:03 මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය විසිතුරු මල් පැල රෝපණය කිරීම 2 වන අදියර සඳහා මල් පෝච්චි සකස් කිරීමේ දී පෝච්චි හැඩයට පෙට්ටි සකසා ගැනීම**

මොහාන් සාලිය එල්ලාවල මාවතේ මධ්‍ය තීරයේ විසිතුරු මල් පැල රෝපණය කිරීම සඳහා පෝච්චි හැඩයට පෙට්ටි 05ක් සකසා ගැනීමට අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස බළන්ගොඩ, ෆොන්සේකා වඩු කාර්මිකයෝ විසින් රුපියල් හැට එක් දහසක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

**2014.09.25 සභා වාරයේදි නගර සභා ගරු මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් අසන ලද ප්‍රශ්න සඳහා නිලධාරි වාර්තා**

**10:01 තානායම ආරම්භයේදි සිට මේ දක්වා එකතු වී ඇති ලාබ මුදල පිළිබඳ වාර්තාව.**

**ගණකාධිකාරිතුමා විසින් මේ සම්බන්ධව ලිඛිත වාර්තාවක් ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදි.**

**10:02 බලගහමුල සේනක පෙදෙස ඉදිරිපිට කුඹුරු ඉඩම්වල ඉදිකරන ගොඩනැගිලි සඳහා කටයුතු කරන ආකාරය පිළිබඳ පැහැදිලි කරන ලද වාර්තාව.**

**වැඩ අධිකාරිතුමා විසින් මේ සම්බන්ධව ලිඛිත වාර්තාවක් ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදි.**

## 11. යෝජනා

**11:01 ගරු උප සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා**

**11:01:01 ශ්‍රී ලංකා ධීවර සංස්ථාවේ වෙළඳසැලක් සඳහා අනුමැතිය ලබාදීමට ගරු සභාවට යෝජනා කිරීම.**

වැඩි තරගකාරිත්වයක් තුළින් පාරිභෝගික ජනතාවට තත්වයෙන් උසස් ආහාර ලබාදීමේ අපේක්ෂාවෙන් ධීවර සංස්ථාවේ මාළු වෙළෙඳ සැලක් ආරම්භ කිරීම සුදුසු බවට ගරු උප සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී. ඒ සඳහා සමූපකාරය පිටුපස හිස් ඉඩම ලබාදෙන මෙන් කරන ලද යෝජනාවට පක්ෂව හා විපක්ෂව අදහස් ඉදිරිපත් විය. එය ආරම්භ කිරීම සඳහා ස්ථානයක් ලෙස සමූපකාරය පිටුපස හිස් ඉඩම යොදාගැනීමේදි මුහුන පෑමට වන නීත්‍යානුකූල තත්වය , පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී.

**11:01:02 නගර සභා පුස්තකාලයේ දමිල පාඨකයින්ට ඇත් පහසුකම් හා එයට අදාළ පොත්පත් වල ස්වභාවය පිළිබද තොරතුරු පුස්තකාලායාධිපතිතුමියගෙන් දළ විස්තරයක් ලබා ගැනීම සඳහා යෝජනා කිරීම.**

මෙහිදී පුස්තකාලායාධිපතිතුමිය ඉදිරිපත් කරන ලද වාර්තාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් එය ප්‍රමාණවත් බව පවසන ලදී.

**11:01:03 වැවවත්ත පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ දමිල ළමුන්ගේ දෙමාපියන්ගේ ඉල්ලීම පරිදි හින්දු ගුරුවරියක් ලබා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරිම.**

වැවවත්ත පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ දමිල ළමුන්ගේ දෙමාපියන්ගේ ඉල්ලීම පරිදි හින්දු ගුරුවරියක් ලබා ගැනීමට සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කල ගරු උප සභාපතිතුමා ,දමිල ළමුන්ට අසාධරණයක් නොවන පරිදි මේ සඳහා සුදුසු ගුරුවරියක පත් කිරීමේ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:02 නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

**11:02:01 පුරණගෙදර මාර්ගයේ ගුණවර්ධන මහතාගේ නිවස අසල ඇති නෙත්ති කාණුව සඳහා බෝක්කුවක් ලබාගැනීමට යෝජනා කිරීම.**

මෙහිදී නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාවේ අවශ්‍යතාවය සළකා බලා දිග අඩි 4ක් වන බෝක්කු 3ක් ලබාදීමට මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:03 නගර සභා ගරු මන්ත්‍රී එම්.ජේ. මලීක්ෂා මැතිතුමා**

**11:03:01 ෆලීල් හජ්ජියාර් පාර ජල ටැංකිය පාර අළුත්වැඩියා කර ගැනීම.**

**11:03:02 ගොරොක්ගහමඩ දූනුමඩලගහවත්ත පාර අළුත්වැඩියා කර ගැනීම.**

**11:03:03 ගොරොක්ගහමඩ කිර්මණ්ඩලය ඉදිරිපිට වටරවුම් පාර අබලන් වී ඇති කොටස තාර දමා අළුත්වැඩියා කර ගැනීම.**

**නගර සභා ගරු මන්ත්‍රී එම්.ජේ. මලීක්ෂා මැතිතුමා විසින් කරන ලද යෝජනා ත්‍රිත්වය මහ සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර ඉදිරි කාල වකවාණුව තුළ එම කාර්යයන් කඩිනමින් සිදු කිරිමට සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**12:01 මුදල් කාරක සභා වාර්තාව**

**2014.10.28 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.**

**එම යෝජනාව ගරු උප සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.**

**12:02 තානායම් කමිටු වාර්තාව**

**2014.10.28 වන දින පැවති තානායම් කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.**

**එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, තානායමේ පාඩු සහගත තත්වය නිසා එය ටෙන්ඩර් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී. ඉදිරියේදි තානායම ටෙන්ඩර් කිරීම සම්බන්ධයෙන් පක්ෂ,විපක්ෂව විවිධ අදහස් ඉදිරිපත් වූ අතර බහුතරයකගේ මතය වූයේ ටෙන්ඩර් කිරීම සුදුසු බවයි. ඒ අනුව තානායම ටෙන්ඩර් කිරීමට මහ සභාවේදි තීරණය කරන ලදී.**

**12:03 සංවර්ධන උපදේශක කාරක සභා වාර්තාව**

2014.10.24 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:03 කර්මාන්ත හා සංවර්ධන කමිටු වාර්තාව**

**2014.10.28 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.**

**එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

**13:01 2014 සැප්තැම්බර් මාසය සඳහා වන ලැබීම් හා ගෙවීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 7,763,574.73 |
| වෙනත් ලැබීම් | 1,305,604.26 |
| මුළු ලැබීම් | 9,069,178.99 |
| පුනරාවර්තන වියදම් | 6,729,681.55 |
| වෙනත් වියදම් | 1,560,879.96 |
| මුළු වියදම් | 8,229,803.69 |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් ඉදිරිපත් නොවූයෙන් මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 2014.09.01 සිට 2014.09.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.09.01 සිට 2014.09.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 524,770.35 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

**මෙදින සභාවේදි වෙනත් කරුණු ඉදිරිපත් නොවිනි.**

## 15. අවසානය

**ගරු සභාපති ඩබ්ලිව්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමා අවසාන වශයෙන් අදහස් දක්වමින් මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ඔවුන් තෘප්තිමත් වන අයුරින් සහයෝගයෙන් කටයුතු කිරීමට අප සියළුදෙනා කැපවිය යුතු බව දන්වමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 1.30 ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.